පාඨකයින් අතර ඉමහත් ආන්දෝලනයකට තුඩු දුන් ත්‍රිත්ව කතා මාලාව "තුන් දෙනෙකු අතර ඇතිවන ලිංගික සම්බන්ධතාවයන් සහ ඒ තුළින් ඇතිවන්නා වූ මත ගැටුම් තේමා කරගත් ත්‍රාසය, කුතුහලය සහ ආදරය මුසු වූ ශෘංගාරාත්මක කතා ත්‍රිත්වයකි.

"මෙම පොත් තුනම එකිනෙකට වෙනස් වූ කතා තුනකින් යුක්ත වන අතර පොත් තුනෙහි චරිත ද එකිනෙකට වෙනස් වූ චරිතයන් ගෙන් යුක්තයි.

ඔබ මේ කියවන්නේ එහි තවත් කතාවක් වන

"බේබි" නවකතාවයි.

ගැහැනියකගේ ජීවිතයේ සෑම පැතිකඩක්ම ස්පර්ශ කරන්නා වූ ජීවිත කතාවක් වන මෙය තුන් දෙනෙකු අතර ඇති වන ලිංගික සම්බන්ධයත්, ඒ තුළින් ඇතිවන්නා වූ කාමුකත්වය, ත්‍රාසය, භීතිය සහ කුතුහලයත් කැටි කර නිර්මාණය කර ඇත.

මා මෙතෙක් ලියූ සෑම නවකතාවක් මෙන්ම "බේබි" ද වෙනස්ම ආරක නවකතාවකි. එය තුන් කොන් ලිංගිකත්වය සියුම්ව ස්පර්ශ කරන්නකි. ශ්‍රී ලාංකේය සාහිත්‍යයේ මෙතෙක් නොලියූ "ජීවිතවල වෙනස්ම පැතිකඩක්" කරළියට ගෙන එන්නකි. ත්‍රිත්ව මුල් පොත මෙන්ම මෙයත් පාඨකයින් අතර "අතිශයින් ජනප්‍රිය" වනු නිසැකයි.

එසේනම් කියවන්න

මේ "බේබි"

ආදර්යේ හොඳම පලිය "අත් නො හැරීම" වූ කල...

බේබි

2021 © මුතුමුදලිගේ නිශ්ශංක

ප්‍රථම මුද්‍රණය : 2021 පෙබරවාරි

ISBN 978-624-5552-00-9

සෝදුපත් පරීක්ෂාව
අශ්විණී ජයවර්ධන

කවර නිර්මාණය
ප්‍රදීප් ප්‍රේමලාල්

පිටු සැකසුම
අමල් තුෂාර වීරක්කොඩි

බෙදාහැරීම
පොත් මී ප්‍රකාශන

මුද්‍රණය
විජේසූරිය එන්ටප්‍රයිසස්,
350/2, හිඹුටාන පාර,
මුල්ලේරියාව.

පොත් මී ප්‍රකාශන
Muthumudalige Holding (Pvt) Ltd'
K Cyril C Perera Mw
Kotahena" Colombo 13

කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම,

ඊ -බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2021

ග්‍රන්ථ ආයතනයේ

දායුන්, තනෝජා සහා නවීන් ඇතුළු

එහි කාර්යය මණ්ඩලයටත්

මුතුමුදලිගේ නිශ්ශංකට

ආදර්ය කර්න්නාවූ

පාඨකයින් සියලුම දෙනාටත්

මම "බේබි" පිරිනමමී!

මේ 1998 සිට 2008 දක්වා කාලය තුළදී ඇමෙරිකාවේ 'සෝල්ට් ලේක්' නගරයේ සිදු වූ සත්‍ය කතාවක්. මේ කතාව පටන් ගන්නනම් අපි ආයෙමත් සෝල්ට් ලේක් වලට යන්න ඕනේ, හැබැයි 1998 ට නෙමෙයි, 2008 ට, කතාව අවසන් වෙන තැන ඉඳන් ආයෙමත් මුලට.

2008 Utha - Salt Lake City

යූතා ජනප්‍රිය මෝර්මන්වරුන්ගේ ජනපදයක් විදියට. 1872 දී මෝර්මන්වරුන් යූතා ජනපදයයට සංක්‍රමණය වීමත් එක්ක යුතා සම්පූර්ණයෙන්ම මෝර්මන් ආගමිකයින්ගේ නිජබිමක් බවට පත් වෙනවා. අදත් යූතා වල ජීවත් වෙන මිනිස්සු බහුතරයක් මොර්මන්වරුන්. එහෙත් මේ කතාව... නැහැ මේක මෝර්මන්වරුන්ටවත්,

මොර්මන් ආගමටවත් අදාල එකක් නෙමෙයි. මෝර්මන්වරුන් සර්ව බලධාරී දෙවියන්ව විශ්වාස කරන මනුස්ස කොට්ඨාසයක්. එහෙත් මේක, යක්ෂයෙක් ගැන. මේ කතාවේ හැටියට, යස්ස ගැහැනියෙක් ගැන... කතාවට වගේම ඇයටත් තියෙන්නේ සුකුමාල නමක් "රේයින්"

හරි - අපි දැන් කතාව පටන් ගමු !

ත්‍රිත්වය 2

බිබී

(ආදරයේ ඔබදම පළිය "අන් නො හැරීමයි")

"බේබි"

අන්ධකාරය

රාත්‍රිය උදාවී ඇත. සෝල්ට් ලේක් ඇන්ඩර්සන් වීදියෙහි අංක 90 දරන නිවසත් රාත්‍රියේ අන්ධකාරයටම කිදා බැස, අඳුරෙන් පිරී ගොස් ඇත. අළුයම දෙකේ ඔරලෝසු කණිසම වැදී හෝරා භාගයක් පමණ ගෙවී යද්දී නිවසේ අන්ධකාර වී තිබුණු නිදන කාමරයේ දොර සෙමෙන් විවර වන්නට විය. එය කොයිතරම් සෙමෙන් විවර වීද යත්, දොර මුළුමනින්ම විවර වීමට තත්පර කිහිපයක්ම ගත වන්නට ඇත. දොරෙන් කිසිදු හඬක් එළියට පැමිණියේ නැත. එහෙත් දොර විවර වී ගෙවී ගිය ඉතිරි තත්පර කිහිපයේදී "ව්‍රීස්" හඬකුත් සමග රෝද විල්ලුද බිම ගැටෙන හඬත්, කිසිවෙකුගේ මුවින් නික්මෙන ගැඹුරු ශ්වසනයත් ඇසෙන්නට පටන් ගත්තේය.

ඊළඟ මොහොතේදී, එම අන්ධකාරය කපාගෙන නිවසේ කාමරය තුළින් එළියට ආයේ රෝද පුටුවකි.

ඒ මත හිඳගෙන සිටි කෙනෙකු එහි රෝද කරකවමින් සාලය කරා එය පදවන්නට පටන්ගෙන තිබිණ.

ඔහුගේ දෑත් වෙවුලුවේය.

ඔහුගේ අත්වලට රෝදය කරකැවීමට තරම් වූ ප්‍රාණයක් නොතිබුණෙන් රෝදය තල්ලු කරදදී ඔහුගේ අත් ඒවායින් ලිස්සා

ගියේය. නාසයට සවි කර තිබුණු ඔක්සිජන් බටය තුළින් හුස්ම ඉහළට ගනිද්දී ඔහුගේ ඉවතට නිරාවරණය වූ පපුවේ ඇට කුහර පවා මනාව පිටතට පෙනෙන්නට විය. ඔහුගේ දෙපය රෝද පුටුවේ එක් පැත්තකට යා වී කිසිදු සෙලවීමකට ලක් නොවී, මුළුමනින්ම අඩපණව ඇත. ඒවායේ ප්‍රාණයක් ඇති බවට කිසිදු සලකුණක් නැත. ඔහු දැඩි පරිශ්‍රමයක් දරමින් රෝද පුටුව කාමරයෙන් අඩි කිහිපයක් ඉවතට ගෙනවිත්, හතිලන්නට පටන් ගත්තේය.

එහෙත් ඔහුගේ ගමන මෙතැනින් හමාර විය යුතු නැත. එතැනින් එහාට ඇත්තේ නිවසේ සාලයයි. ඉන්පසුව සාලයේ ප්‍රධාන ද්වාරයයි. ඔහු මේ ආ ගමනින්ම එම දොර වෙත ගමන් කළ යුතුය.

ඔහු නාසයට සම්බන්ධ කර තිබුණු ඔක්සිජන් බටය එක් අතකින් ගලවා අයින් කළේය. එය බාධාවකි. එය ඔහුට අවශ්‍ය නැත. මඳ වෙලාවක් හති ලෑ ඔහු යළිත් ඔහු හැකිතරම් වීරියක් දරා දැත් වලින් රෝද පුටුව ඉදිරියට තල්ලු කළේය. "ඕස් ඕස්.." හඬ නඟමින් එය සෙමෙන් සෙමෙන් සාලය දෙසට එන්නට පටන් ගත්තේය.

නිවසේ ඉදිරිපස වූ විදුලි ලාම්පු වලින් සාලයට මඳ ආලෝකයක් ලැබී තිබුණු මේ මොහොතේ, එම ආලෝකය තුළින් ඔහුගේ මුහුණ යාන්තමින් දැක ගත හැක.

ඔහුට ඇත්තේ කවාකාර, බැලීමට තරම් අප්‍රසන්න වූ, කැළැල් වලින් පිරී ඇති මුහුණකි. ඔහුගේ දෙනෙත් ප්‍රමාණයට වඩා විශාල වූ අතර, දෙතොල් මහත් වී තිබිණ. ඔහුගේ තට්ට හිස සාලයට වැටුනු ආලෝකයත්, පිරී ගිය දහඩියත් නිසා දිලිසෙමින් තිබිණ.

ඔහුගේ මුහුණේ වූයේ දැඩි ආවේගයකි, එය අතිශයින්ම භයංකාර පෙනුමකින් යුක්ත විය. යක්ෂයෙක් පසු පස හඹා එද්දී එයින් ගැලවීමට දුව යන අසරණයෙකු මෙන් ඔහු භීතියට පත් වී සිටියේය. ඒ භීතිය නිසාම ඔහුගේ ගෙලෙහි නහර වැල් ඉලිප්පී ගොස් ඇත. ඔහු දැඩි ලෙස කෘෂ වී සිටියෙන් එළියට ඉලිප්පී තිබුණු එම නහර වැල් මනාව පිටතට පෙනෙන්නට විය.

සාලයේ අඩක් දුරට ළං වෙත්ම ඔහු තවත් යුහුසුළු වන්නට පටන් ගත්තේය. දෑත් වලින් රෝදවලට පහර දෙන්නාක් මෙන් ඒවා ඉදිරියට තල්ලු කරන්නට විය. රෝදත් පොළව දිගේ ආයාසයකින් ඇදි ගියේය. තවත් අඩි දෙකක් පමණ ඉදිරියට පැමිණි ඔහු යළිත් නතර විය.

ඔහු මුළුමනින්ම වෙහෙසට පත් වී ඇත. රෝදයක් අඩි දෙකකට වඩා දුරක් තල්ලු කිරීමට තරම්වත් ප්‍රාණයක් ඔහු තුළ නොමැත. ඔහුගේ දෑස් කෙවෙනි කඳුලින් පිරී යන්නට විය. අහිමී වී ගොස් ඇති සිය ශක්තිය ගැන ඔහු සංවේදී වන්නට ඇත. මේ කෙටි දුරෙහි ඇති වෙහෙසකර බව නිසාම ඔහුගේ ළය පෙදෙස වේගයෙන් ඉහළ පහළ යන ආශ්වාස ප්‍රශ්වාසයෙන් උස් පහත් වෙන්නට පටන් ගත්තේය. ඔහුට දැන් නැවැත්විය නොහැක. කෙසේ හෝ දොර අගුල වෙත ගොස් එය කරකවා එතැනින් එළියට යා යුතුය. ඔහු යළිත් ගමන පටන් ගත්තේය. ශක්තිය මුළුමනින්ම යොදවා යළිත් රෝදය තල්ලු කරන්නට විය. ඔහුගේ සෑම ආශ්වාසයක්ම කොයි තරම් දැඩි වීද යත්, කොයි මොහොතක හෝ වේගයෙන් උස් පහත් වෙන ඔහුගේ පපුව පුපුරා හදවත එළියට එනු ඇතැයි එය දකින කෙනෙකුට සිතෙනු ඇත.

විනාඩි කිහිපයක ගමනකින් පසුව ඔහු රෝද පුටුව නිවසේ ද්වාරය වෙතට ගෙන ආවේය.

එතැනට පැමිණි පසුව ඔහුගේ දෑස් දීප්තියෙන් බබළන්නට පටන් ගත්තේය. ඒවා තුළ ප්‍රීතියක් වර්ධනය වන්නට විය. ඔහු තම වෙවුලන දෑත් පාදයන් අතරට යොමා ඒ තුළ සඟවා ගෙන සිටි යතුරු කැරැල්ලක් එළියට ගත්තේය.

දැන් ඔහු තම ගමනේ අවසන් මොහොත වෙතට ළඟා වී ඇත. යතුරු කැරැල්ල සීරුවෙන් ඉහළට එසවූ ඔහු, අතෙහි වෙවුලීම වළක්වා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දරමින් කැරැල්ලෙන් යතුරක් ගෙන එය දොරෙහි අගුල තුළට රිංගවීමට උත්සාහ කළේය.

එහෙත් එක්වරම ඔහුගේ පිටුපසින් ඇසුණු හඬකින් ඔහුව කම්පාවෙන් වෙවුලා ගියේය.

"බේබි"...

ඔහු එම හඬින් කොයිතරම් බියට පත්වීද යත් ඔහුගේ දෑස් කෙවෙනි තුළින් ඉලිප්පී විත්, ඔහුගේ මුවින් භයංකාර තැතිගැන්මක් නැඟී ආයේය. එම තැතිගැන්මත් සමගම ඔහුගේ අතෙහි වූ යතුරු කැරැල්ල හඬක් නඟමින් එතැනම බිමට ඇද වැටින.

එහෙත් නිවස තුළින් ආයේ බියට පත්වී කැළඹිය යුතු ආකාරයේ හඬක් නොව, හිතාමත් සුකොමළ මිහිරි හඬකි.

"බේබි"

එම මිහිරි, කරුණාවන්ත හඬ යළිත් වරක් නිවසේ අභ්‍යන්තරයෙන් ගලා ආයේය.

රෝද පුටුවේ සිටි තැනැත්තාට තම හිස පිටුපසට හැරවීමට තරම් හැකියාවක් නොතිබුණෙන්, ඔහු තම දෑස හැකිතරම් පිටුපසට හැරවූයේය. අන්ධකාරය විනා ඔහුගේ දෑසට කිසිවක් පෙනුනේ නැත. එහෙත් එම හඬ කුමක්දැයි ඔහු ඒ වන විටත් හඳුනාගෙන තිබිණ. ඔහු බියෙන් සංත්‍රාසයට පත් වී තිබුණේ ඒ නිසාවෙනි.

"බේබි"

එය මෙවර ඔහුට වඩාත් ආසන්නයෙන් ඇසෙන්නට විය.

එම හඬත් සමග අන්ධකාරය තුළින් පිටතට පැමිණි කාන්තාවක් සෙමෙන් පියවර තබමින් ඔහු වෙතට එන්නට පටන් ගත්තාය. ඇය තරබාරු, වැඩි උසක් නැති, මුළුමනින්ම සුදු පැහැ වී ගිය ක්‍රේල් හිස කෙස් වලින් යුක්ත වූ, වයසක පෙනුමකින් යුත් කාන්තාවකි. කාමරයේ සිට රෝද පුටුව වෙත සෙමෙන් පියවර නැඟූ ඈ, රෝද පුටුව අසලට පැමිණි විගසම හැංගිමුත්තන් කරන කුඩා දරුවෙකුව සොයා ගත් මවක මෙන් එක්වරම එහි සිටි තැනැත්තා ඉදිරියට පැන්නාය.

"ඔන්න මම ඔයාව අල්ලගත්තා" ඇය සිනහවකුත් සමග ඔහුගේ මුහුණට නැඹුරු වී පැවසුවාය. ඇගේ මුහුණේ වූයේ ව්‍යාජ සිනහවක් නොව, ප්‍රීතියෙන් මුසපත් වූ කාන්තාවකගේ මුවින් නැගෙන්නාවූ සැබෑම සිනහවකි.

එහෙත් ඇයගේ ඒ සිනහවෙන් රෝද පුටුවේ සිටි තැනැත්තා තවත් තැතිගත්තා මිස සංසුන් වූවේ නැත. මාරයාගේ අවසන් ප්‍රහාරයට ලක් වූවෙකු මෙන් ඔහු වෙවුලා ගියේය.

"ඔයා කොහේද... යන්න... ගියේ...?"

රිද්මයානුකූලව මිමිණූ ඇය ඔහුගේ දෑසට තවත් ළං වූවාය.

ඔහුගේ මුඩු හිසින් නැඟුනු දහඩිය මුහුණ දිගේ පහතට යමින් ඇත. එය දුටු විගසම ඇයගේ ප්‍රීතියෙන් වෙළී ගොස් තිබුණු මුහුණට එක්වරම වේදනාවක් ආරෝපනය විය.

"බලන්න බේබී, ඔයාව හොඳටම තෙත් වෙලා..." ඈ දුක්බර හඬකින් කීවාය.

ඒ සමගම ඇය හිටගත්තාය. ඈ ඇඳ සිටි ගවොම කලවා වලටත් උඩට වෙන්නට ඔසවාගෙන එක් කකුලක් රෝද පුටුවෙහි අත්වාරුව උඩ තබා, උඩට ගත් ගවොම් දාරයෙන් ඔහුගේ හිස පිසදමන්නට පටන් ගත්තාය. ඇයගේ යටිබඩ පෙදෙස මුළුමනින්ම නිරුවත්ව ඇත. හිස පිසදමන අතරම, ඔහුගේ තොල්වලට ගෑවෙන තරමටම ඇය තම යෝනිය ඔහුගේ මුහුණට ළං කළාය. ඇගේ ගවොමට වැසී තිබුණු ඔහුගේ මුහුණ පිටතට නොපෙනුනත්, ඇය කකුල පහතට ගනිද්දී ඔහු සිටියේ දෙනෙත් මුළුමනින්ම වසා ගෙනය.

කකුල පහතට ගත් පසු ඈ ඔහුගේ දෙනෙත් දෙස මඳහසකින් යුත් බැල්මක් හෙලුවාය.

"ඉස්සරනම් ඔයා ඒකට කැමතියි බේබී" ඇය ඔහු දෙස බලා එම සිනහවත් සමග ලැජ්ජාවෙන් මෙන් මිමිණුවාය. ඉන්පසුව ඔහුගේ දෑස වෙත ළංවී මෙසේ කීවාය.

"ඉස්සර මම එහෙම ළං කළාම ඔයා ඒක උරනවා, එහෙත් ඔයා දැන් වෙනස් වෙලා" ඇයගේ මුහුණ වේදනාවකින් එක්වරම වෙනස් වී ගියාය. එම දුක්බර පෙනුමද ඇයගේ දැස් තුළ වැඩි වෙලාවක් තිබුණේ නැත. එතැන බිම වැටී තිබුණු යතුරු කැරැල්ල දැකීමෙන් පසුව එය එසැණින්ම කෝපයකට පෙරලුණාය.

"ඔයා හරිම නෝට්" කෝපය සහා දුක මිශ්‍රත ස්වරයකින් ඈ කෑ ගැසුවාය.

ඉන්පසුව බිම වැටී තිබුණු යතුරු කැරැල්ල ගෙන ගවොම් සාක්කුවේ දමා ගත් ඇය රෝද පුටුවේ අත්වාරුවෙන් අල්වා එය වේගයෙන් කාමරය දෙසට හැරවූවාය.

"අපි යමු කාමරේට... ඔයාට අදනම් දඬුවමක් දෙන්නම වෙනවා මේ කරපු නෝට් වැඩේට"

ඇය තරහයෙන් මුමුණමින් ඔහුගේ රෝද පුටුවත් තල්ලු කරගෙන කාමරය වෙතට යන්නට විය.

නිදහසේ කුරුල්ලෝ

වෙලාව උදැසන නවයට ආසන්නව ඇත. උදැසන හිරු එළිය කාමරයේ කවුළු තුළින් ඇඳට වැටෙද්දී එම ආලෝකයෙන් රෙයින් අවදි වුවාය. ඇය අවදි වූ විගසම ඇඳ මත සිටි ඇයගේ සැමියා දෙස බැලුවාය. ඔහු උඩු යටිකුරුව ඇඳෙහි වැතිර ඇත. ඔහුගේ එක් අතක් ඇඳෙහි පලුවකට කර ගාංචු දමා ඇති අතර, ඔහුගේ කටින් හඬක් නොනැඟෙන සේ ඇයගේ පැන්ටියක් කටට ඔබා ඇත. ඒ දෙස බලද්දී ඇයගේ මුහුණ වේදනාවකින් පිරී ගියේය. ඒ වේදනාවත් සමගම ඔහුගේ බූ ගා තිබුණු හිස සෙමෙන් පිරිමැදි ඇය, ඔහුගේ කටේ ඔබා තිබුණු පැන්ටිය ඉවත් කරන්නට විය.

ඔහු අවදි වූයේ නැත. එසේත් නැතහොත් ඒ බවක් නොපෙන්වා දෙනෙත් වසාගෙන සිටින්නට ඇත. පැන්ටිය මුවින් ඉවත් කළ පසුව ඇය පෙරෝනය මඳක් ඉවත් කොට ඔහුගේ නිරුවත් පිට පෙදෙස දෙස බැලුවාය. ඔහුගේ ශරීරයෙහි පසුපස කොටස කැළලි වලින් පිරී ගොස් ඇත. ඒවායෙන් බොහෝමයක් ඈ විසින් පසුගිය අවුරුදු කිහිපය පුරාවටම ඔහු කරන වැරදි නිසාවෙන්, බෙල්ටයෙන් පහරදීමෙන් සිදුවූ කැළලිය. රාත්‍රියේදී ඇ ගැසූ බෙල්ට් පහරවල් තුනත් ඒ අතරින් ඉදිමී නෙරා විත් ඇත.

"ඕ... මගේ බේබී... ඔයා ඇයි බේබි මාව දාල යන්න

හැදුවේ...? ඇයි ඔයා රේයින්ව තරහා ගැස්සුවේ...? අනේ ඇයි බේබි ඔයා එහෙම කළේ...? බලන්න දැන් ඔයාට වෙලා තියෙන දේ" කී ඇය ඔහුගේ පිටෙහි වූ කැළලි වලට හාදු දෙමින් ඔහුගේ හිස සෙමෙන් පිරිමදින්නට පටන් ගත්තාය.

ඒත් සමගම ඇයට පිටුපස වූ ඔරලෝසුවෙන් නවයේ කණිසම නාද දෙන්නට පටන් ගත්තෙන් ඈ ලහිලහියේ ඇඳෙන් නැඟිට සිටියාය.

රාත්‍රියේ පොරෝනය යට නිදාගත් ආකාරයටම ඇයත් ඔහුත් දෙදෙනාම නිරුවතිනි.

ඇඳෙන් නැඟිටගත් ඈ නිරුවතින්ම ජනේලය අසලට ගොස් කන් හිරිවැටී යන හඬකින් යුක්තව ජනෙල් තිර දෙපැත්තට ඇද්දාය. ඒ වනතෙක් වසාගෙන සිටි ඇගේ සැමියාගේ දෙනෙත් එම හඬත් සමග විවර විය. රේයින් ඔහු දෙස බලද්දී ඔහුගේ නිල්පැහැති දෙනෙත් ඈ දෙසට හැරී තිබිණ. සූර්යාලෝකය වැටීමෙන් ඔහුගේ දෙනෙත් වල ඇති අඳුරු නිල් පැහැය තවත් වර්ණවත් වී ඇත. ඒ දෙස බලා සිටියදීම රේයින් ගේ මුවින් මඳහසක් නික්ම ආවේය.

"මම ආසම ඒකට" ඈ සෙමෙන් මිමිණුවාය.

"මම ආසම උදේ පාන්දර ඔයාගෙ ඔය ඇස් දෙක දිහා බලන්න" කී ඇය නිරුවතින්ම ඇඳට පැන්නාය. පැන ඔහුගේ නළලට හාද්දක් දී, ඔහු සමග සිනාසුනාය. ඇයගේ සැමියා බලාගත් අත බලා සිටියා විනා කිසිවක් කීමට උත්සාහ කළේවත් නැත. රාත්‍රිය පුරාම රෙදි පාන්කඩ පුරවා තිබීමෙන් ඔහුගේ මුව මඳක් ඉදිමී තිබිණ. ඇය ටියුපෝව මත තිබුණු කුඩා යතුරක් ගෙන ඔහුගේ අත් ගාංචුව ලිහා, අත එයින් මුදා හැරියාය.

"මට සමාවෙන්න බේබි, මම ඔයාට පනිෂ් කළාට,

ඔයා මේ රේයින්ට සමාව දෙනවා නේද?

කියන්න බේබී... ඔයා මට සමාව දෙනවා නේද?"

ගාංචු ගලවන ගමන් ඇය කරුණාවන්තව පැවසුවාය.

එහෙත් ඔහු පෙර සේම නිශ්ශබ්දව සිටියා විනා කිසිවක් කීවේ නැත. ගාංචු ගලවා දැමූ පසුව ඇය ඔහුගේ මුහුණට තම මුහුණ ළං කොට වෙනස් වූ ගැඹුරු ස්වරයකින් මෙසේ ඇසුවාය.

"බේබී, ඔයා රේයින්ට සමාව දෙනවා නේද?"

ඇගේ මුවින් නික්මුණේ තර්ජනාත්මක හඬකි. එයත් සමග ඔහුගේ දෑස ඇගේ දෙනෙත් වෙතට යොමු විය. ඒවා එක දිගට කිහිප වාරයක්ම වේගයෙන් ඇහිපිය ගසන්නට පටන් ගත්තේය. ඒ ඇසිපිය ගැසීමත් සමගම ඔහුගේ උගුරෙන්

"ඕ.. ඕ" යනුවෙන් සියුම් හඬක් නික්ම ආවේය.

ඒ ප්‍රතිචාරය කුමක්දැයි රේයින් හඳුනාගන්නට ඇත. ඇය ඔහුත් සමග සිනාසුනාය.

"මගේ හොඳ බේබී"

ඇය බොහෝම කරුණාවන්තව ඔහුගේ මුඩු හිස අත ගා ඉමහත් ප්‍රබෝධයෙන් යුක්තව ඇඳෙන් හිටගත්තාය. සිටගෙන ජනේලයේ ආලෝකය හොඳටම වැටෙන ඉසව්වට ගොස් බැලේ තාලයට අත් දෙක ඉහළට ඔසවා නිරුවතින් රිද්මයානුකූල නර්තනයක් ඉදිරිපත් කළාය. ඇයට ඇත්තේ තරබාරු සිරුරකි. ඇයගේ ඉදිරියට නෙරාවිත් තිබුණු බඩ එම නර්තනයෙන් වැනෙන්නට පටන් ගත්තේය. ඇයගේ පියයුරු බඩ අසලටම දික් වූ විශාල තරබාරු ඒවා වූයෙන් හා ඒවා එහාට මෙහාට සෙලවෙමින් කළ නර්තනය නිසාවෙන් අවලස්සන රිද්මයක් මතු විය. ඇගේ කලවා සහ තට්ටම් ප්‍රදේශය ප්‍රමාණයෙන් විශාල වූ නිසාම ඒවායේ මස් පහතට එල්ලෙමින් ඇත. නර්තනය අතර තුර ඇය තම රහස් ප්‍රදේශය ඔහුට පෙන්වමින් එය ඔහුගේ මුහුණටම වඩාත් ළං කරමින් යළිත් ඈතට ගනිමින් එයින් ඔහුව සංතර්පණය කිරීමට උත්සාහ කළාය. එහෙත් ඔහු දඬුවමට බියෙන් නිහඬවම ඒ දෙස බලා සිටියාක් වීනා කිසිදු චලනයක් කළේ නැත.

නර්තනය අවසානයේ ඈ රූප රාජිනියන් ඇවිදින්නාක් මෙන් ජනේලය අසල සිට ලාලිත්‍යවත් ගමනකින් ඇවිද විත්, සැමියා වැතිර සිටි ඇඳ අසලදී ඔහු වෙත නැමී ආචාර කොට එම නර්තනය අවසන් කළාය.

ඔහුගේ දෑස ඇය වෙත රැඳී ඇත. ඒ දකිද්දී ඇගේ මුහුණ ලැජ්ජාවකින් මෙන් හැකිළී ගියේය. ඈ එක් අතකින් තම විශාල පියයුරුත්, අනිත් අතින් රහස් ප්‍රදේශයත් වසාගෙන ලැජ්ජාශීලී ගමනකින් බිත්තිය මුල්ලට දුව ගොස් සැඟව ගත්තාය.

"බේබී... ඔයා ඔහොම රේයින් දිහා බලාගෙන ඉන්නකොට මට ලැජ්ජයි" ඇය එතැන සිට ලැජ්ජාවෙන් කෑ ගැසුවාය.

"ඔයා ඇස් වහගන්න, අනේ ඔය ඇස් වහ ගන්නකෝ" ඇය දැතින්ම තම විළි වසාගෙන කීවාය.

ඔහු දෑස වසා ගත්තේය.

ඒත් සමගම ඈ විළි වසා සිටි අත්ල ඒවායින් නිදහස් කොට සෙමෙන් සෙමෙන් ඔහු අසලට අඩි තැබුවාය.

"ඔහොමම ඇස් වහගෙන ඉන්න, හොරා වගේ ඇස් හරින්න එපා" ඔහු අසලට එන ගමන් ඈ ගීයක් මෙන් මිමිණුවාය.

ඔහු අසලට පැමිණ, ඇඳෙහි වූ පොරෝනය මුළුමනින්ම ඉවත් කළ ඈ ඔහුව දැතින්ම ඔසවා එතැන වූ රෝද පුටුවෙහි හිඳවූවාය. ඉන්පසුව රෝද පුටුවත් තල්ලු කරගෙන කාමරයෙන් පිටතට එන්නට වූවාය.

කාමරයෙන් පිටතට පැමිණෙද්දී එහි දොර අසල වූ ලෝගු එල්ලනයෙන් තුවායක් අතට ගත් ඇය, එය තම සිරුර වටා ඔතා ගත්තාය. එය ඇඟලා ගත් පසුව මහත් ප්‍රබෝධයකින් යුක්තව නිවසේ සාලයේ වූ ජනෙල්වල තිර රෙදි මුළුමනින්ම විවෘත කොට හිරු එළිය නිවස තුළට ගලාගෙන ඒමට සැලැස්සූවාය.

මෙය දිනපතාම ඇය විසින් කරන දෙයකි.

නිරුවතින්ම සැමියාත් සමග අවදි වෙන ඇය,

මුලින්ම කරන්නේ නිදන කාමරයේ ජනේලය අසලදී ඇය තරුණ කාලයේදී ඔහුට පොරොන්දු වූ එම 'නිරුවත් බැලේ නැටුම' රඟ දැක්වීමයි. එය දැකීමෙන් සැමියා ප්‍රීතිමත් වන බවත්, උදෑසනම ඇතිවන ඒ ප්‍රීතියත් සමග ඔහු දවස පුරාම සතුටින්

සිටින බවත් ඈ විශ්වාස කළාය. ඉන්පසුව පුරුදු පරිදිම ඔහුට ආචාර කොට නැටුම නවත්වන ඇය ඔහුව රෝද පුටුවේ හින්දවා, කාමරයේ ද්වාරය අසලදී තම නිරුවත වැසෙන්නට තුවායක් සිරුරෙහි ඔතාගෙන ඔහුත් සමගම නිවසේ සාලයට පැමිණෙයි. සාලයට විත් ඉමහත් වූ ප්‍රබෝධයකින් යුක්තව තිර රෙදි විවර කරන්නට පටන් ගනියි. ඒවා විවර කරන ගමන් ඇය රෝද පුටුවේ සිටින තැනැත්තා දෙස සිනහවකින් යුතුව බලමින් මෙසේ පවසයි.

"අද තමයි ජීවිතයේ හොඳම දවස බේබී... ජීවිතයේ හොඳම දවස... ඔයයි රේයිනුයි ගොඩක්ම සතුටින් ඉන්න දවස"

එම වදනින් පසුව, සැමදාමත් කරන්නාක් මෙන් සැමියාගේ රෝද පුටුව තල්ලු කරමින් ඈ නාන කාමරය වෙතට යන්නට පටන් ගනියි. යමින් ගමන් උරුවම් බාමින් සිහින් හඬින් ගීතයක් මුමුණයි.

"කුරුල්ලෝ... අහසේ සතුටින් හිඳී...

බේබී ඔයයි මමයි වගේ...

නිදහසෙන් හරි නිදහසෙන්"

ඇයගේ උරුවම් බෑමත්, මුවින් පිටවූ කන්කළු ගීත නාදයත් සමග රෝද පුටුවෙහි සිටින තැනැත්තාගේ හදවත වේගයෙන් ගැහෙන්නට පටන් ගනියි. එතැනින් පසුව වෙන දේ ඔහු හොඳාකාරව දන්නා නිසාවෙන්, ඔහුගේ මනස භීතියකින් පිරී ගොස් ඔහුගේ දෑත් සෙමෙන් වෙවුලන්නට පටන් ගනියි.

එහෙත් එය එසේ නොවිය යුතු මොහොතකි.

ඈ එම ගීය මුමුණද්දී ඔහුද සෙමෙන් ඇයගේ තාලයටම එය මිමිණිය යුතුය. නාන කාමරය තුළට යන මොහොත තෙක් ඇය විසින් සැමදා මුමුණන මෙම

"නිදහස් කුරුල්ලන්ගේ" ගීතය ඔහු විසින්ද මිමිණිය යුතුය.

හදවතෙහි පොපියමින් පැවති බිය සෙමෙන් යටපත්

කරගත් ඔහු ඇගේ තාලයටම හිමින් මුමුණන්නට පටන් ගත්තේය. ඔහුගේ මුවින් රාවයක් පිට වූයේ නැත. එයින් නැඟුනේ උගුරෙන් නැගෙන හඬක් පමණි.

එවිට රේයින් ඔහුට දිගු හාදුවක් දුන්නාය.

"මගේ හොඳ බේබි... අපි දෙන්නම සතුටින්...

ඔයත් සතුටින්, රේයිනුත් සතුටින්" කී ඇය පෙරටත් වඩා හඬකින් උරුවම් බාන්නට පටන් ගත්තාය.

"නිදිය ගත්තු මගේ බේබි ඇහැරෙනවා"

ඔවුන් නාන කාමරයට ඇතුළු විය. නාන කාමරයට පැමිණි පසුව රේයින් එහි එක් පැත්තකින් තිබුණු ජනේලය සම්පූර්ණයෙන්ම පිටතට විවර කළාය. එයින් පිටත ඇත්තේ ගස් වලින් පිරී ගිය ලඳු කැලෑවකි. ජනේලයෙන් පිටතට මුහුණ එබූ ඈ එතුළින් හමා එන පිරිසිදු වාතයට නාසය දිගු කර දිගු හුස්මක් ඉහළට ඇදගත්තාය. එම හුස්මත් සමග ඇයගේ මුහුණ ප්‍රබෝධයෙන් ප්‍රාණවත් විය. ඈ උරුවම් බාමින් නාන කාමරයේ එක් පැත්තක තිබුණු දර්පනය සහිත කැබිනෙට්ටුව වෙතට ගමන් කළාය. එය ඉදිරියේ සිටගෙන දර්පනයෙන් පෙනෙන තම මුහුණ දෙස විනාඩි කිහිපයක් බලා සිටින්නට වූවාය.

මා කලින් කීවාක් මෙන් ඇයට ඇත්තේ රවුම්, තරබාරු මුහුණකි. අප්‍රිකානු කාන්තාවන්ගේ මෙන් බොකුටු හිසකෙස් වලින්ද, පැතලි, රතු ලප වලින් ගහන වූ නාසයකින් සහ වයසට යෑම නිසාම අවර්ණ වූ තොල් වලින්ද ඈ යුක්ත විය. දර්පනයෙන් පෙනෙන තම මුහුණ දෙස බලා සිටියදීම ඇයගේ දෙනෙත් එම දර්පනයෙන්ම පෙනෙන රෝද පුටුව දෙසට යොමු විය. ඒ මත

හිඳ සිටි නිරුවත් තැනැත්තාගේ හිස අප්‍රාණිකව පහතට කඩා වැටී ඇත. ඔහුගේ දෙනෙත් වැසී ගොස් ඇත. ඒ දෙස බලාගෙන සිටියදීම ඇය ඔහුට කතා කළාය.

"බේබී... හොර කරන්නෙපා... ඔයා දැන් නාන්න ඕනේ" කාරුණික හඬකින් කියූ ඇ, දර්පනයේ පැත්තක තිබුණු කොක්කක් ඇද කැබිනෙට්ටුව විවර කළාය.

ඒ තුළ ඇත්තේ විවිධ වර්ණ වලින් යුක්ත වූ ප්ලාස්ටික් බෙහෙත් බෝතල් ගොඩකි. එයින් එක් බෝතලයක් පිටතට ගත් ඇ, ඒ තුළ වූ බෙහෙත් කරලක් ගෙන අතෙහි රඳවාගෙන කබඩ්ඩුව වසා දැම්මාය. ඉන්පසුව නාන කාමරයේ අනෙක් පස වූ කරාමය වෙතට ගොස් එතැන තිබුණු වීදුරුවකට වතුර පුරවා අතෙහි වූ බෙහෙත් කරල කඩා ඒ තුළට දමා, ඇඟිල්ලෙන් හොඳින් දිය කරන්නට පටන් ගත්තාය.

බෙහෙත් කුඩු වතුරට දිය වී ගිය පසුව එයත් සමග රෝද පුටුව වෙතට පැමිණි ඇය එම වීදුරුව තම සැමියාගේ තොල් මත තබා මුව ඉහළට එසවූවාය.

"සේරම බොන්න බේබී... හොර කරන්නේ නැතිව" බෙහෙත් වතුර කටට වත් කරන ගමන් ඇය පැවසුවාය.

මොහොතකින් වීදුරුව සම්පූර්ණයෙන්ම හිස් විය. එය ඇයගේ සන්තෝෂයට හේතුවන්නට ඇත. ඇය හිස් වූ වීදුරුව දෑතෙහි රඳවාගෙන රෝද පුටුවේ සිටි සැමියාගේ නිරුවත් ලිඟුව දෙස හරි කෙලින් බැලුවාය. එසේ බලන ගමන් මොලොක් හඬකින් ගීතයක ආකාරයෙන් මෙසේ මිමිණුවාය.

"තව ටිකකින් මගේ බේබි ඇහැරෙනවා,

නිදිය ගත්තු මගේ බේබි ඇහැරෙනවා"

ඇ එසේ පවසත්ම රෝද පුටුවේ සිටි තැනැත්තා මුහුණ ඔසවා ඇය දෙස බැලුවේය. ඔහුගේ දෑස් කඳුලින් පිරී ගොස් ඇත.

රේයින් එය ගණන්ගත් බවක් පෙනෙන්නට නැත.

ඇය නාන ටැබයේ කරාමය විවර කළාය. එය වතුරින් පිරෙන තෙක් ඔහුගේ හිස බූ ගාන්නට පටන් ගත්තාය. ඔහුගේ හිසෙහි එකදු හිස කෙසක්වත් තිබුණේ නැත. එහෙත් ෂේවින් ක්‍රීම් බෝතලය සොලවා එය ඔහුගේ හිසට ඇත්කෙරූ ඇය සබන් පෙණ වලින් හිස මුළුමනින්ම පිරී යනතෙක් ඒවා හිසෙහි ඇතිල්ලුවාය. ඉන්පසුව රේසරය ගෙන ඔහුගේ හිස මුඩු කරන්නට පටන් ගත්තාය.

"අද මගේ බේබි ලස්සනට ඉන්නට ඕනේ, අද සෝල්ට් ලෙක් උත්සවයනේ, ඒකට බේබියි, ඔයාගේ රේයිනුයි යන්න ඕනේ" කී ඇය රේසරය මඳක් ඉවතට ගෙන, ජනේලයෙන් පෙනෙන ලඳු කැලැව දෙස බලාගෙන කල්පනා කරන්නට විය.

"බේබි දන්නවද පළවෙනි තෑග්ග කීයක්ද කියලා?" ඇය ඔහුගේ කනට කර ඇසුවාය. ඔහුගේ දෑස වතුර පිරී යන නාන ටැබයට යොමුවී ඇත.

"ඩොලර් දහදාහක් බේබී... ඩොලර් දහදාහක්. ඒක අපි කොහොම හරි අරගන්න ඕනේ, ඒ නිසා බේබි නෝට් වෙන්නෙ නැතිව රේයින් කියන විදියට ඉන්න ඕනේ, තේරුණාද?" ඇය රේසරය ඔහුගේ මුහුණට ළං කර පැවසුවාය. ඔහු පිළිතුරු දුන්නේ නැත. එයින් ඇයගේ මෙතෙක් වූ කරුණාවන්ත ස්වරූපය එක්වරම වෙනස් විය. ඇය ඔහුගේ මුහුණ මත තබාගෙන සිටි රේසරය කම්මුල දිගේ පහතට ඇද්දාය. එයින් මුහුණ කැපී ගියෙන් ඔහු වේදනාවෙන් වෙවුලන්නට පටන් ගත්තේය. රේයින් කලබයට පත් වූවාය.

"සමාවෙන්න බේබි... සමාවෙන්න... මගේ අත ගැස්සුනා" කී ඇය නාන ටැබයෙන් වතුර ගෙන ඔහුගේ කම්මුලෙන් ආ රුධිරය පිසදාන්නට පටන් ගත්තාය. ඔහුගේ දෑස් තුළින් නැඟී ආ කඳුළු කම්මුලෙන් ගලා ගිය රුධිරයටම එකතු විය.

"බේබී... ඔයා මම කියන විදියටම ඉන්නවා නේද?"

සබන් වතුරින්ම තුවාලය පිසදාන ගමන් ඇය කලින් ඇසූ ප්‍රශ්නයම යළිත් ඇසුවාය. රෝද පුටුවේ සිටි තැනැත්තා වේගයෙන් ඇසිපිය ගසන්නට පටන් ගත්තේය. රේයින් ගේ අඳුරු

වී තිබුණු මුහුණ යළිත් සන්සුන් වූවාය.

"ඒකනේ... මම දන්නවනේ මගේ බේබි රේයින් කියන දේ අහනවා කියලා" ඇය මඳ සිනහවකින් යුක්තව කීවාය.

"මේකෙන් පස්සෙ තව මාස දෙකකින් යූතා වලිනුත් අපිට ආධාර ලැබෙනවා" ඇය තවත් කල්පනාවකින් නිහඬ වූවාය.

"ඊට කලින් බේබිගේ අත් දෙකත් සම්පූර්ණයෙන්ම පණ නැතිවෙලා ගියොත්, අද ලැබෙන ඉන්ෂූරන්ස් එකෙන් තවත් සල්ලි ගන්න පුළුවන්" කී ඇය, ඔඩොක්කුවේ තබාගෙන සිටි ඔහුගේ දෑත දෙස බැලුවාය.

එයින් ඇයගේ සැමියා කලබලයට පත් විය. ඔහු රෝද පුටුවේ සිටියදීම දඟලන්නට පටන් ගත්තේය. ඔහුගේ මුවින් විලාපයකදී නැගෙන්නාක් මෙන් විස්සෝපයෙන් බර වූ හඬක් නැගෙන්නට විය. ඔහුට කතා කිරීමට හැකියාවක් නොමැත, මීට වසර කිහිපයකට පෙර සිදුකරන ලද සැත්මකින් පසුව ඔහු ගොළු වී සිටියේය. ඔහුගේ මුවින් හඬක් වෙනුවට, බැරැන්ඩි උගුරකින් නැගෙන ආකාරයෙන් කෑ ගැසීමක් නිකුත් විය.

එහෙත් ඇය එය ගණනකට ගත්තේ නැත. උරුවම් බාමින් ඇය "නිදහසේ කුරුල්ලනේ" ගීතය යළිත් මුමුණන්නට පටන් ගත්තාය. ඇයගේ උරුවම් බෑමත් සමග රෝද පුටුවේ සිටි තැනැත්තාගේ විලාපයත් කෙමෙන් අඩු වී ගියේය. ඔහුගේ දැසින් කඳුළු කඩා වැටෙන්නට විය. එහෙත් ඔහු එම වේදනාව යටපත් කර ගත්තේය, ඒ වෙනුවට ඇයත් සමග ඔහුගේ ගොළු මුවින් නාදයක් පිටකරමින් "නිදහසේ කුරුල්ලන්ගේ" ගීතය මතුරන්නට විය.

එය එසේ විය යුතුය. ඇය "නිදහසේ කුරුල්ලන්ගේ" ගීතය මුමුණන ඕනෑම මොහොතක ඔහුත් ඇයත් සමග එකතු වී එය ගායනා කළ යුතුය. එසේ නොවුවහොත් තුණ්ඩු තුනෙන් එක් දඬුවමකට ඔහු අනිවාර්යෙන්ම යටත් විය යුතුය.

එම ගීතය මුමුණමින් සිටියදීම ඈ ඔහුව ඔසවා වතුරින් පිරී තිබුණු බාත් ටැබයේ හිඳවූවාය. ඔහුගේ උරහිස අසලටම ටැබයේ වතුර පිරී ඇත. ඇය එහි දාරය මත හිඳගෙන ඔහුගේ

හිසෙහි වූ සබන් පෙණ ඉවත් කළාය. ඉන්පසුව එක් අතක් වතුරට දමා ඈ සෙමෙන් සෙමෙන් ඔහුගේ ලිංගය පිරිමදින්නට පටන් ගත්තාය. පිරිමදින ගමන් උරුවම් බාමීන් ගීයක ආකාරයෙන් මෙසේ කීවාය.

"බේබී, ඔයා දැන් නැඟිටින්න ඕනේ, ඔයාගේ බබීට ආදරේ කරන්න ඔයා දැන් නැඟිටින්න ඕනේ" ඇය එසේ කියමින් පිරිමැදීම තවත් වේගවත් කළාය.

ඇයගේ වේලාව මැනීම නිවැරදිනම් "බෙහෙත්" දීමෙන් විනාඩි දහයකට පසුව එය ප්‍රාණවත් විය යුතුය. හිස මුඩු කිරීමට විනාඩි දහයක් ගොස් ඇති බැවින් ඒ මොහොත තවත් තත්පර කිහිපයකින්ම උදාවනු ඇත. තවත් ස්වල්ප වේලාවක් එය අත්ලෙන් පිරිමැද, ඇඳ සිටි තුවාය ගලවා දැමූ ඇය වතුරින් පිරී ගිය බාත් ටැබයේම නිරුවතින් ඔහුගේ ඔඩොක්කුවෙහි හිඳගත්තාය.

"බේබී"

එය සම්පූර්ණයෙන්ම ශරීරය තුළට කිඳා ගිය කල ඈ කෙඳිරුවාය. ඇගේ දෑස් වැසී යන්නට විය. ඒ මත හිඳගෙන සිටියදීම ඈ ලාලිත්‍යකට උස් පහත් වෙන්නට පටන් ගත්තාය. බාත් ටැබයේ වූ වතුරත් ඒ රිද්මයට අනුව දෙපසට රැළි නංවමින් නාන කාමරය පුරා ඉහිරී යන්නට විය.

මේ මගේ බේබී

සෝල්ට් ලේක් වාර්ෂික ආධාර ප්‍රධානෝත්සවයට සියල්ලම සූදානම්ව ඇත. රේයින් ඇයගේ ආදරණීය ස්වාමිපුරුෂයා හිඳගෙන සිටි රෝද පුටුවේ අත්වාරුව අල්වාගෙන තම වාරය පැමිණෙන තුරු වේදිකාව පිටුපස සිටගෙන සිටියාය. ඇයට පිටුපසින් සහ ඉදිරියෙන් තවත් කිහිප දෙනෙකුම පෝලිමෙහි රැඳී ඇත. ඔවුන්ගෙන් බොහෝමයක් රෝද පුටුවල හිඳගත් අබ්බගාතයින් වූ අතර තවත් සමහරු ඇනරොක්ෂියා, ආතරයිටිස්, ලියුකේමියා සහ පිළිකාව වැනි දරුණු රෝග වලින් පෙළී, ඒවා නිසාම ශාරීරිකව සහා මානසිකව "සදාකාලික බෙලහීනත්වයට" පත් වූ අයවළුන්ය. ඔවුහු එම රෝග නිසාම ආර්ථික අපහසුතාවයන්ට පත්ව, අසරණත්වයට පත්වූවෝ වූහ. අද සෝල්ට් ලේක් වාර්ෂික ආධාර ප්‍රදානෝත්සවයේදී, සියලු සාන්තුවරුන්ගේ දේවස්ථානය සහ සෝල්ට් ලේක් නගර සභාව එක්ව ඔවුන් සියලු දෙනාටම ආධාර මුදල් ලබා දීමට නියමිතව ඇති අතර, එසේම ඔවුන්ගෙන් විශේෂීත වූ තිදෙනෙකු තෝරාගෙන, ඔවුන්ට පිළිවෙලින් ඩොලර් දහදාහක, පන්දාහක සහා දෙදාහක තැගි මුදල් තුනක් සහ වසර පහක රෝහල් රක්ෂණ ආවරණයක්ද ලබා දීමට කටයුතු කරනු ඇත.

මේ එළඹී ඇත්තේ ආධාර ප්‍රධානෝත්සවයේ විශේෂීතම අවස්ථාවයි. මෙහිදී අවසන් වටයට තෝරාගෙන ඇති දසදෙනා වේදිකාව මතට නැඟ ඔවුන් පිළිබඳව කෙටි කතාවක් සිදුකළ යුතුය. එසේම ප්‍රධාන තැගි මුදල දිනාගත හැකි වුවහොත් එයින් ඔවුන්

කිරීමට යන්නේ කුමක්ද යන්නත් පැහැදිලිව සභාවට ඉදිරිපත් කළ යුතුව ඇත. ඔවුන්ගේ රෝගී ස්වභාවය සහ ඉදිරිපත් කිරීම මත වේදිකාව පහත සිටින දූනපතීන් සහ විනිශ්චය මණ්ඩලය මෙම වසරේදී ප්‍රධාන ත්‍යාගය ලබා ගන්නා රෝගියාව තීරණය කරනු ඇත.

රේයින් රෝද පුටුව අල්වාගෙන ඇයගේ වාරය පැමිණෙන තුරු බලා සිටිද්දී ඇයට ඉදිරියෙන් සිටි වයසක කාන්තාවක් කිහිලිකරුවක ආධාරයෙන් සෙමෙන් සෙමෙන් වේදිකාව මැද වූ මයික්‍රෆෝනය වෙතට ගොස්, හඬමින්, වැලපෙමින් ඇයගේ දුක් ගැනවිල්ල ඉදිරිපත් කළාය. එය දකිද්දී රේයින් කෝපයෙන් රතු වී ගියාය.

"පිස්සු ගෑනි, ඉක්මනට ඔතනින් බැහැලා පල"

ඇය මුමුණන්නට වූවාය.

එම ගැහැනිය එතැනින් ඉවත් වී යන තුරු දත් මිටි කමින් නොඉවසිල්ලෙන් බලා සිටි රේයින්, විටින් විට තම සැමියා දෙසට හැරී,

"බේබී... ඔයා ලෑස්තියි නේද?" යි අසමින් ඔහුගේ කම්මුලට හාදු දෙන්නට පටන් ගත්තාය. ඇගේ පාදයන් නොඉවසිල්ල නිසාම වෙවුලමින් තිබිණ. ඇය රෝද පුටුවේ අත්වාරුව තදින් අල්වාගෙන තබාගේ නම ඇසෙන සැණෙකින් වේදිකාව වෙතට යෑමේ බලාපොරොත්තුවෙන් බලා සිටියාය.

කිහිලිකරු මත සිටි කාන්තාව අවසානයේදී ඇගේ හැඬුම නවත්වා වේදිකාවේම අනිත් පසින් නොපෙනී ගියාය. ඇයගේ පිටත්ව යෑමත් සමග වේදිකාව පහතින් අත්පොළසන් හඬ ඇසුණෙන් එය රේයින්ගේ කෝපය තවත් වැඩි කළේය.

ටික වේලාවකින්ම රේයින්ගේ නම කතා කරනු ඇයට ඇසිණ.

"සැන්ද්‍රා කාර්ල්සන්"

ඇය තම කොණ්ඩය සකසා ගත්තාය. කෝපයෙන්

රතු වී තිබුණු මුහුණ ප්‍රබෝධවත් සිනහවකට පෙරළා ගනිමින්, දිගු හුස්මක් ඉහළට ඇද සන්සුන් වූවාය. ඉන්පසුව කිසිවෙකුටත් නොපෙනෙන ලෙස රෝද පුටුව පිටුපස අටවා තිබුණු ඔක්සිජන් ටැංකියෙන් සැමියාගේ නාසයට ලබාදෙන ඔක්සිජන් මට්ටම අඩු කළ ඇය රෝද පුටුවත් තල්ලු කරමින්, මුහුණ පුරා ඇඳී ගිය ලොකු සිනහවකින් යුක්තව වේදිකාවට සම්ප්‍රාප්ත වූවාය.

ඈ සුදු මල් වැටුනු ගවොමක් ඇඳ සිටි අතර, ඇයගේ සැමියාට ඩෙනිම් කලිසමක් සහා සුදු පැහැ ටී ෂර්ටයක් අන්දවා තිබිණ.

ඔහුගේ හිස එක් පැත්තකට බරවී ඇත.

රේයින් ඔහුට මෙම උත්සවයට ඒමට පෙර දුන් "සොල්පිඩියම්" නිසාවෙන් ඔහුගේ දෑස් සෙමෙන් සෙමෙන් වැසී යමින් තිබිණ. නාසයයට ලබා දෙන ඔක්සිජන් ප්‍රමාණය අවම කර තිබුණු නිසාවෙන් ඔහු අපහසුවෙන් හුස්ම ගනිද්දි, ඔහුගේ දෙනෙත් විටින් විට විවෘත වන්නට වූවේය.

මුහුණ පුරා පිරී ගිය සතුටු සිනහවකින් යුක්තව වේදිකාව මැදට පැමිණි රේයින්, එතැන වූ මයික්‍රෆෝනය ගෙන, එය සැමියාගේ මුහුණට ළංකොට

"නිදහසේ කුරුල්ලෝ" ගීතය මුමුණන්නට පටන් ගත්තාය. ඈ එය මුමුණද්දී ඇයගේ සැමියාත් අපහසුවෙන් හුස්ම ගනිමින්, උගුරෙන් නැගෙන විකෘති හඬකින් ඊට එකතු වූවේය.

"කුරුල්ලන් නිදහසින්,

පියඹා යති අහසේ...

බේබියි... රේයිනුයි වාගේ...

හරිම නිදහසින්... හරිම නිදහසින්"

මුලින්ම කැඩීගිය ස්වර වලින් යුක්ත වූ එම ගීතය පසුව රේයින්ගේ මිහිරි උස් හඬ නිසා වේදිකාව පහත සිටි අමුත්තන් අමන්දානන්දයට පත් කළ කන්කළු ගීතයක් බවට පත් විය. ටික

වේලාවකින් වේදිකාව පහත අසුන්ගෙන සිටියවුන්ද එම ගීතයට එකතු වූ අතර, නිදහසේ කුරුල්ලෝ ගීතය ශාලාව පුරා පිළිරැව් දෙන්නට පටන් ගත්තේය.

රේයින් එම ගීතයේ අවසන් කොටස ගයද්දී ඇයගේ උරුවම් බෑමත් එයට එකතු කළාය. ඒ උරුවම් බෑමෙන් සියල්ලෝම මවිතයට පත්වූහ. එය ශාලාවේ සිටි සියල්ලන්වම ආකර්ශණය කරගැනීමට සමත් විය. එයින් ඔවුන් කොයි තරම් පිනා ගියේද යත්, සමහරු වේදිකාව මතට ගොඩ වී රේයින් සහ ඇයගේ සැමියාගේ අත් අල්වාගෙන එම ගීතය ගායනා කරන්නට පටන් ගත්තෝය. රේයින්ගේ මුහුණ දැඩි සතුටකින් පිරී ගියේය. ඈ මුළු ශාලාවම පිනවමින් සිටියාය, ඊටත් වඩා වේදිකාව ඉදිරියේ සිටි සියල්ලන්වම ඇය තම ග්‍රහණයට නතු කරගෙන සිටියාය.

ඇය ගීතය ගායනා කර අවසන් කරද්දි වේදිකාව පහත සිටි සියල්ලෝම ඔවුන්ගේ ආසන වලින් නැඟිට අත්පොළසන් දුන්නෝය. වේදිකාව මත සිටියවුන් රේයින්ව වැළඳගෙන ඇයට සුබ පැතුවෝය. මුළු ශාලාවම ප්‍රීතියකින් පිරී ගොස් තිබුණු මෙම මොහොතේදී ගීතය වෙනුවෙන් ඔල්වරසන් දුන් සැමට ස්තුති කරමින් ඇය ඇගේ කතාව පටන් ගත්තාය.

"ස්තුතියි සෝල්ට් ලේක්... ස්තුතියි, ඔයාලා හැමෝටම ගොඩක් ස්තුතියි"

එය ඇසෙත්ම ශාලාවේ සිටි සියල්ලෝම නිශ්ශබ්ද වූවෝය.

"මගේ නම සැන්ඩ්‍රා කාර්ල්සන්, මේ මගේ බේබි"

ඇය පහතට නැමී සැමියාගේ මුඩු හිසට හාද්දක් දුන්නාය. එයින් සතුටට පත් වූ අමුත්තන් යළිත් අත්පොළසන් නගද්දී ඇය සිනහවකින් එය පිළිගෙන දැසින් කඳුළු වගුරවමින් හඬන්නට වූවාය.

"මගේ බේබිගේ නම ෆ්‍රෑන්ක්, අපි විවාහවෙලා අවුරුදු දහයක් ගෙවිලා යද්දි මගේ බේබි ලොකු අනතුරකට ලක්වුණා. ඒ අවාසනාවන්ත අනතුර නිසා අපේ ජීවිතේ එහෙන් පිටින්ම වෙනස් වෙලා ගියා. මගේ බේබි අඛ්බගාතයෙක් විදියට රෝද

පුටුවට කොටු වුණා, අපේ ජීවිතේ නරකම කාලයට අපිට මුහුණ දෙන්න සිදුවුණා"

ඇගේ කටහඬ ශෝකයෙන් බරවී ගියේය. ඇගේ මුවින් නික්ම ආ හැඩුම් හඬ මයික්‍රෆෝනය ඔස්සේ ශාලාව පුරා ගලා යද්දී එතැන සිටි සමහරු වේදනාවේන් සුසුම්ලන්නට වූවෝය.

"අද බේබි ඉන්න තත්වය දකිද්දි මගේ හිතට ලොකු වේදනාවක් ඇති වෙනවා. බේබි මෙහෙම හිටිය කෙනෙක් නෙමෙයි" කී ඇය ගවොම් සාක්කුවෙන් ගත් පින්තූරයක් වේදිකාව ඉදිරියේ අටවා තිබුණු කැමරාවට පෑවාය. එම ඡායාරූපය කැමරාව තුළින් වේදිකාවේ පැත්තකින් වූ පුළුල් තිරයේ දර්ශනය වූ අතර එය දකිද්දී වේදිකාව පහත සිටි අමුත්තෝ පුදුමයට පත්වූවෝය.

එහි වූයේ කායවර්ධන තරඟයක් නියෝජනය කරන ශක්තිමත් තරුණයෙකුගේ ඡායාරූපයකි. ඔහුගේ ශරීරය නිරෝගී, ව්‍යායාම් නිසා මනාව හැඩ වූවකි. එය ශක්ති සම්පන්නය. ඔහුගේ රූපයද පියකරු, කඩවසම් රූපයකි. තඹවන්, උරහිස තෙක් විහිදි ගිය දිගු කොණ්ඩයකුත් ඔහුට ඇත.

එය කැමරාවට පෙන්වූ පසු රේයින් යළිත් ඇගේ කතාව පටන් ගත්තාය.

"එදා ඒ අනතුරින් පස්සේ මගේ සැමියා සම්පූර්ණයෙන්ම පැරලයිස් වුණා. මේ ඉන්නේ මගේ බේබි අද" කී ඈ දෙනෙතින් කඩා වැටුනු කඳුළු පිස දමමින් රෝද පුටුවේ වූ සැමියා දෙසට අත දිගු කර පෙන්නුවාය.

"මගේ බේබි, අද මේ විදියට එක්තැන් වෙලා ඉන්න එක මම කොහොම උහුලන්නද? මෙයා මෙහෙම දුක් විඳින්න ඕනෙ කෙනෙක් නෙමේ. රජෙක් වගේ ඉන්න ඕනේ කෙනෙක්. සමහරවිට මේක අපේ දෛවය වෙන්න ඇති. එහෙත් මම ඒ අවාසනාවන්ත දෛවයට බය නැහැ. මමයි බේබියි අවුරුදු දහයක් මේ ජීවිතෙත් එක්ක සටන් කළා. ඉදිරියටත් එහෙමයි, මගේ බේබිව සනීප කර ගන්නකන් මම මේ අවාසනාවන්ත දෛවයත් එක්ක සටන් කරනවා. මට විශ්වාසයි, මගේ බේබිව මට කොහොමහරි සනීප කරගන්න පුළුවන් වේවි."

කී ඇය මයික්‍රෆෝනය සිය මුඛය අසලම තබාගෙන නිහඬ බැල්මකින් වේදිකාව පහත සිටි අමුත්තන් දෙස බැලුවාය.

"අද මට මේ තෑගය ලැබුණත් නැතත්, මම ඔයාලා හැමෝටම ස්තුති කරනවා. ඔයාලා වගේ රත්තරං මිනිස්සුන්ගේ හදවත් නිසා තමයි අපි වගේ අසරණ මිනිස්සු ජීවත් වෙන්නේ, ඒ වෙනුවෙන් ඔයාලා හැමෝටම ගොඩක් ස්තුතියි"

ඈ එසේ පවසද්දී රෝද පුටුවේ සිටි ඇගේ සැමියා ආවේගශීලී වූවේය. ඔහු හුස්ම ගැනීමේ දැඩි අපහසුවකින් පෙළුණු අතර, ඊටත් වඩා රේයින්ගේ බොරු මවාපෑම් නිසා කෝපයට පත් වී ඇත. ඔහු දැතින් රෝද පුටුවට පහර ගසමින්, දෑස් ඉහළට ඔසවමින්, උගුරෙන් ශබ්දයක් පිට කරමින් කෑගසන්නට වූවේය. එය දුටු රේයින් ඔහු අසල දණගසා ගත්තාය. ඔහු කරන්නට හදන්නේ කුමක්දැයි දැනගත් ඈ ඔහුව තදින් වැළඳගෙන, ඔහුගේ පිටුපසට එක් අතක් දමා පෙරදින පහරදීමෙන් ඇතිවී තිබුණු ඉදිමීම තදින් මිරිකුයෙන් ඔහු යටිගිරියෙන් කෑගසන්නට පටන් ගත්තේය. එම කෑගැමත් සමග වේදිකාව ඉදිරියෙන් සිටියවුන් කලබල වූවෙන් රේයින් සිනාවකින් පිටුපස බලා

"එය එතරම් දෙයක් නොවන බවට" ඇඟවීමට මෙන් ඇස් පුංචි කර සංඥාවක් කොට, මෙසේ පැවසුවාය.

"හරි හරි බේබි, මට ඔයා කියන එක තේරෙනවා. දැන් අඬන්නැතිව ඉන්න... මගේ බේබි, දැන් අඬන්නැතිව ඉන්න"

එසේ පවසමින්ම ඇය රෝද පුටුවේ බඳේ සවිකර තිබුණු ඔක්සිජන් බටයේ ස්විචය කැරකුයෙන් යළිත් සාමාන්‍ය ප්‍රමාණයටම එයින් ඔක්සිජන් ගලාගෙන ඒමට පටන් ගත්තේය.

ඒ අතර ඇය ඔහුගේ කනට කර යමක් මිමිණුවාය.

එයත් සමගම රෝද පුටුවේ සිටි තැනැත්තාගේ කෑගැසීම කෙමෙන් කෙමෙන් වියැකී යන්නට වූවේය. රේයින් තවත් ස්වල්ප වෙලාවක් ඔහුව වැළඳගෙන සිටියාය. ඉන්පසුව එතැනින් නැඟිට ගත් ඇය.

"බේබි හරිම සංවේදී කෙනෙක්, එයාට දුකයි අපිට